www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජර්මානු හරිත පක්ෂ නායක ජොෂ්කා ෆිෂර් ඇෆ්ඝනිස්ථාන යුද්ධය වෙනුවෙන් රන බෙර වයයි

## German Green leader Joschka Fischer bangs the drum for Afghanistan war

2009 දෙසැම්බර් 10

ඇෆ්ඝනිස්ථාන යුද්ධය වර්ධනය වීමෙන් ජර්මානු ආන්ඩුව හමුවේ දැඩි දුෂ්කරතා නිර්මානය වී ඇත. යුද්ධය තුල දී ජර්මනියේ ගමන් මග කුමක් විය යුතු ද යන්න සම්බන්ධයෙන් චාන්සලර් කාර්යාලයෙන්, විදේශ අමාත්‍යාංශයෙන් සහ බැවේරියානු රාජ්‍යයීය චාන්සලර් කාර්යාලයෙන් නිකුත් වී ඇත්තේ එකිනෙකට ප්‍රතිවිරුද්ධ ප්‍රකාශයන් ය.

ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (සීඩීයූ) සභාපතිනිය ද ජර්මානු චාන්සලර්වරිය ද වන ඇන්ජිලා මර්කල් ආරක්ෂක ලේකම් කාල් තියඩෝර් වොන් ගුටෙන්බර්ග් (ක්‍රිස්තියානි සමාජ සංගමය – සීඑස්යූ) සමග එක් වී ජනවාරි මස අග වෙද්දී ජර්මානු හමුදා විහිදුවීම තව දුර වැඩි කිරීමක් නිවේදනය කිරීමට ලකලෑස්ති වෙමින් සිටින්නී ය. ඒ අතරවාරයේ සීඑස්යූවේ සභාපතිවරයා ද බැවේරියානු අගමැතිවරයා ද වන හොරස්ට් සීහොෆර් එවැනි පියවරකට එරෙහිව ප්‍රසිද්ධියේ තර්ක කර ඇත. නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (එෆ්ඩීපී) සභාපතිවරයා ද ජර්මානු විදේශ ඇමතිවරයා ද වන ගුයිඩෝ වෙස්ටර්වෙල් මෙම ගැටලුව පිලිබඳව මුනිවත රකිමින් සිටී.

මෙම අපසරනයන්ට පිටුපසින් පවතින්නේ යුද්ධයට එරෙහිව වැඩෙන මහජන විරුද්ධත්වය යි. මෑත දී කල ජනමත විමසුමකට අනුව, ප්‍රශ්න කිරීමට ලක් කලවුන්ගෙන් සියයට 69ක් ම ඇෆ්ඝනිස්ථානයෙන් හැකි තරම් ඉක්මනින් ජර්මානු හමුදා ඉවත් කර ගැනීමකට පක්ෂව අදහස් පල කලහ. සැප්තැම්බරයෙහි පැවති තත්ත්වය සමග සසඳන කල මෙය සියයට 12ක වැඩි වීමකි. ජනමත විමසුමට අනුව සියයට 77කගේ අදහස වූයේ ආන්ඩුව ඇෆ්ඝනිස්ථානයෙහි හමුදා විහිදුවීම ගැන තමන්ට අවංක දැනුම් දීමක් කර නැති බව යි.

ජනමත විමසුමේ ප්‍රතිඵල ගැන ඩර් ස්පීගල් පුවත්පත මෙසේ අදහස් දැක්වී යඃ "ඇෆ්ඝනිස්ථානයෙහි හමුදා විහිදුවීම වර්ධනය වෙද්දී ඊට එරෙහිව නැගෙන විරුද්ධත්වයට ඇති තරම් ඉක්මනින් විසඳුම් සෙවීමට ආන්ඩුවට පුලුවන්කමක් නැත."

යුද්ධයේ කෲරත්වය එන්න එන්න ම වර්ධනය වීමෙන් ද වංචනික ඇෆ්ඝන් ජනාධිපතිවරනයෙන් සහ හමීඩ් කර්සායි තන්ත්‍රයේ උමතු සහගත දූෂනයෙන් ද එමෙන් ම කුන්ඩුස් ප්‍රදේශයෙහි මෑත කාලීනව සිදු වූ ජන සංහාරයෙන් සහ ජර්මානු ආන්ඩුව එය වසං කිරීමෙන් ද යුද්ධය යුක්ති සහගත සඳහා සැපයුනු නිල තර්කනයට යටින් වල කැපී ඇත. ජර්මනියෙහි සිටින කිසිවෙකු ඇෆ්ඝනිස්ථානයෙහි සිටින ජර්මානු හමුදාවේ කාර්ය භාරය වන්නේ ලිං කැපීම, ඇෆ්ඝන් ස්ත්‍රීන් විමුක්ත කර ගැනීම, සිවිල් ජනයා ආරක්ෂා කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම යැයි අද දවසේ විශ්වාස කරතොත් ඒ යන්තමිනි. කෙසේ වුව ද, සැලකිය යුතු තරමේ හේතු නිසා යුද්ධයේ සැබෑ අරමුනු එලිදරව් කිරීමෙහි ලා ආන්ඩුව පසුබට වෙමින් සිටී.

ඇෆ්ඝනිස්ථානයෙහි හමුදා විහිදුවීම ආරක්ෂා කිරීම සඳහා ප්‍රසිද්ධියේ කතා කරන්නටත් ඒ සඳහා අලුත් යුක්ති සහගත කිරීම් සපයන්නටත් ජොෂ්කා ෆිෂර් පෙරට විත් තිබෙන්නේ මෙම පසුබිමට එරෙහිව යමිනි. ජර්මානු හමුදාව ජාත්‍යන්තරව විහිදුවීමට එරෙහි පශ්චාත් යුද තහංචි සිඳ බිඳ දැමීමෙහි ලා පලමු සහ එක ම හරිත පාක්ෂික විදේශ ඇමතිවරයා (1998-2005) ලෙස සිටිය දී ෆිෂර් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කලේ ය. හොලෝකෝස්ටයෙන් ලද උරුමය බෝල්කානු කලාපයෙහි සිදු විය හැකි ජන සංහාරයක් වැලැක්වීම සඳහා ජර්මනියට බල කලේ යැයි නරුම තර්කයක් ඉදිරිපත් කරමින් ජර්මානු හමුදාව කොසෝවෝ යුද්ධයට සහභාගි වීම යුක්ති සහගත කලේ ෆිෂර් ය. ජර්මානු

හමුදා ඇෆ්ඝනිස්ථානයට පිටත් කර යැවීම සිදු වූයේ ද ඔහුගේ නිල කාලය අතරතුර දී ය.

ෆිෂර්ගේ මෑත ම අදහස් දැක්වීමෙහි සුපැහැදිලිව දිස් වන දෙය නම් ඔහු තව දුරටත් මානුෂීය තර්ක විතර්ක පදනම් කර ගනිමින් ඇෆ්ඝනිස්ථානයෙහි හමුදා විහිදුවීම යුක්ති සහගත කිරීමට උත්සාහ නොකරන බව යි. ඒ වෙනුවට ඔහු විශේෂිතව භූ-දේශපාලනික අරමුනු සඳහන් කරයි.

"ඇෆ්ඝනිස්ථානයෙහි සිදු වන ගැටුමෙහි මූලය වත් අර්ථය වත් එම රට තුලින් ම සොයා ගත නොහැකි යැ"යි *සුඩොයුට්ෂෙ සෙයිතුං* පුවත්පතට කල ප්‍රතිපදානයක දී ෆිෂර් ලියයි. "සංග්‍රාම භූමිය ඇෆ්ඝනිස්ථානය වන මුත් 1970 ගනන්වල සිට එරට විනාශයෙහි හෙලූ යුද්ධවල හේතු පැවතියේත් දැනටත් සොයා ගත හැකි වන්නේත් එහි දේශ සීමාවලින් පිටත ය. එනිසා විශේෂිතව 'ඇෆ්ඝනිස්ථානමය වූ විසඳුමක්' ඇති විය නොහැකි ය."

ෆිෂර්ට අනුව, සෝවියට් හමුදාව ඇෆ්ඝනිස්ථානයෙන් ඉවත් කර ගැනීමෙන් පසුව 1989 දී ආරම්භ වූයේ

"හින්දු කුෂ් ප්‍රදේශය අරබයා කලාපීය අසල්වැසියන් අතර සිදු වුනු බලකාර යුද්ධයකි." සෞදි අරාබියේ සහාය ලද පකිස්ථානය "ප්‍රයෝගයෙහි දක්ෂ සිය සතුරා වන ඉන්දියාවට එරෙහි මූලෝපායාත්මක ගැඹුරක් සෙවී ය," එම අරමුන උදෙසා තලෙයිබාන්වරුන් සජ්ජිත කලේ ය. ඉරානය ෂියාවාදී සුලුතරයේ සහාය ඇතිව සිය අවශ්‍යතා ආරක්ෂා කර ගත්තේ ය, උතුරුදිග අසල්වැසියෝ (රුසියාව ද ඇතුලු) තජික් උතුරුදිග සන්ධානයේ ද උස්බෙක් භට කන්ඩායම්වල ද සහාය සෙවී ය.

"අනුවන ක්‍රියාවක්" යැයි ෆිෂර් නම් කරන 2003 මාර්තු මාසයේ දී සිදු වූ ඉරාක ආක්‍රමනයෙන් අදහස් වූයේ එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් "ඇමරිකාවේ මිලිටරි ශක්තිය නාස්ති කර දමන්නේ ය යන්න පමනක් නො වේ," "ඉරානය මුලු මහත් කලාපයෙහි ම භූ-දේශපාලනමය ක්‍රීඩකයා බවට පත්ව වූ" බව යි.

ෆිෂර් නොකඩවා ලියයිඃ "එනිසා අද දින ඇෆ්ඝන් ප්‍රහේලිකාව සමග පොර බදන්නන් පලමු කොටත් ප්‍රමුඛ කොටත් කලාපීය යථාර්ථයන් ගැන සැලකිලිමත් විය යුතු යඃ බටහිරයන් සිටින්නේ හමුදා ඉවත් කර ගත හැකි තත්ත්වයක ද?"

ෆිෂර් ඉපැහැදිලි "නැහැ" යන්නකින් මෙම ප්‍රශ්නයට පිලිතුරු දෙයි, ඒ අතර පැහැදිලිව අර්ථදක්වන ලද ඉලක්කයක් පදනම් කර ගනිමින් යුද්ධය අඛන්ඩව ඉදිරියට ගෙන යා යුතු යැයි ඉල්ලා සිටියි - එනම්, රට යලිත් කලාපීය අවශ්‍යතාවන් එකිනෙක ගැටෙන සංග්‍රාම භූමියක් බවටත් අල් කයිඩාවේ සංවිධානමය පදනමක් බවටත් නැවත පත් වීම වැලකෙන ස්ථාවරත්වයක් ඇෆ්ඝනිස්ථානය තුල ඇති කිරීම යි." ඔහු මෙසේ ද ලියයිඃ "ප්‍රමානවත් මිලිටරි බලයකින් තොරව, සහ වැඩි දියුනු කල සහ සවිබල ගැන්වූ යලි ගොඩ නැගීමේ ප්‍රයත්නයන්ගෙන් තොරව මෙම ඉලක්කය සපුරා ගත නොහේ."

මෙය වනාහි එලිදරව්කාරී පාපෝච්චාරනයකි. "හින්දු කුෂ් ප්‍රදේශයෙහි බලය" කලාපීය අසල්වැසියන්ට අත් හැර නොදැමෙනු පිනිස හරිත පක්ෂයේ ප්‍රධානියා පිටසන යොදන්නේ දැනට මත් සිවිල් වැසියන් දහස් ගනනකගේ ජීවිත අහිමි කොට ඇති සහ නිසැකව ම තවත් දසදහස් ගනනකගේ මරනවලට හේතු වනු ඇති යුද ප්‍රසාරනයකට ය. හරිත පක්ෂයේ වත්මන් ප්‍රකාශකයන් ඔවුන්ගේ ප්‍රකාශවල දී යම් තරමකට වඩා සුපරීක්ෂාකාරී වන නමුදු ෆිෂර්ට තම පක්ෂයේ සහාය ලැබේ.

ෆිෂර් පැහැදිලිව පෙනෙන ප්‍රශ්නයට, එනම් එක්සත් ජනපදයට සහ එහි යුරෝපා සගයන්ට රටේ කලාපීය අසල්වැසියන්ට වඩා වැඩියෙන් "හින්දු කුෂ් ප්‍රදේශයෙහි බලය" පාවිච්චි කිරීමට අයිතියක් ඇත්තේ මන්දැයි යන්නට පිලිතුරු නො දෙයි. ඔහු යුද්ධය ඉදිරිපත් කරන්නේ ත්‍රස්තවාදය, ඉස්ලාමීය රැඩිකල්වාදය, න්‍යෂ්ටික තර්ජන ගර්ජන, කලාපීය ගැටුම් සහ දුරින් පෙනෙන බිඳී විසිරී යාම විශේෂිතව ඉලක්ක කොට ගනිමින් එක්සත් ජනපදයත් එහි සගයනුත් කරන පරාර්ථකාමී මැදිහත් වීමක් හැටියට ය.

ෆිෂර් වඩා හොඳට දනියි. ප්‍රධාන යුරෝපා බලශක්ති සමාගම්වලට මධ්‍යම ආසියාවෙහි පවත්නා ස්වාභාවික ගෑස් සංචිත ගසා කෑම සඳහා ඉදි කෙරෙන නබුකො නල මාර්ග ව්‍යාපෘතියෙන් වැටුප් ලබන බලපෑම්කාරකයෙකු ලෙස කටයුතු කරන ෂිෆර් වූකලි ඛනිජ තෙල් සහ ගෑස් – ඇෆ්ඝනිස්ථානයෙහි යුද්ධයට ගිනි ලා ඇති සම්පත් මේවා ය – සඳහා වන අරගලයේ පෙරමුනෙහි ම සිටින්නෙකි.

හිටපු විදේශ ඇමතිවරයෙකු වන ෆිෂර්, ස්බිග්නිව් බ්‍රෙෂෙන්ස්කිගේ මූලෝපායාත්මක සංකල්ප ගැන කුලුපග ලෙස දැන සිටී. එක්සත් ජනපද ජනාධිපති ජිමී කාටර්ගේ ජාතික ආරක්ෂක උපදේශකයා ලෙස හිඳිමින් ඇෆ්ඝන් මුජාහිදීන් ව්‍යාපාරයට සහාය දීමේ එක්සත් ජනපද වැඩ පිලිවෙලට මුල පිරුවේ මෙකී බ්‍රෙෂෙන්ස්කි ය. 1998 දී පල කල *The Grand Chessboard* (ද ග්‍රෑන්ඩ් චෙස්බෝඩ්) නම් කෘතියෙහි, 21 වන සියවසේ දී එක්සත් ජනපදයේ ගෝලීය අධිපතිත්වයට යතුර වන්නේ මධ්‍යම ආසියාවෙහි පාලනය අත් කර ගැනීම ය යන ප්‍රවාදය බ්‍රෙෂෙන්ස්කි වර්ධනය කලේ ය. ඔහු ඇෆ්ඝනිස්ථානයට විශේෂිත අර්ථභාරයක් ඈඳා ලී ය.

ෆිෂර්ට අනුව, මධ්‍යම ආසියාවේ මිනිරන් සම්පත්වලටත් කලාපය තුල "බටහිරයන්ගේ" අධිපතිත්වයටත් පිවිසීම සඳහා සියලු උපක්‍රම යෙදීම අත්‍යවශ්‍ය ය. ජර්මානු සහ ඇමරිකානු අවශ්‍යතාවන් එකිනෙකට අනන්‍ය නොවන නමුදු, ඇෆ්ඝනිස්ථානයේ දී ඇමරිකාව ලබන මොන යම් පරාජයකින් වුව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අධිකාරයට ආපසු හැරවිය නොහෙන හානියක් ගෙන දෙනු ඇතිවා පමනක් නො ව ඒ තුල යුරෝපා බලවතුන් විෂයෙහි ද බලපාන ප්‍රගාඪ ඇඟවුම් ගැබ්ව තිබෙනු ඇත. අත්ලාන්තිකය දෙපස හිඳිමින් සෘජු ප්‍රහාරයක් එල්ල කරන්නට නැගී එන ජාතීන් වන චීනයට, ඉන්දියාවට සහ රුසියාවට හැකි වන, සහ ඔවුන් එවන් ප්‍රහාරයක යෙදිය යුතු වන "චෙස් ලෑල්ලක්" ලෙස ඇෆ්ඝනිස්ථානය සේවය කරන්නී ය.

ෂිෆර්ට පවත්නා "ලොකු ම ප්‍රශ්නය" වන්නේ "එවැනි කර්තව්‍යයක් භාර ගැනීමට එක්සත් ජනපදයට සහ එහි යුරෝපා සගයන්ට තව මත් ශක්තිය, වීර්යය සහ දුර දක්නා නුවන තිබෙන්නේ ද" යන්න යි. ඔහු මෙසේ සටහන් කරයිඃ "මෙය ගැන සැක පහල කිරීමට ඇති තරම් හේතු පවතී. විකල්පය වනු ඇත්තේ ගිනියම්ව තිබෙන මෙම විසල් ලක්ෂ්‍යයෙහි අවුල් සහගත වූත් භයානක වූත් අනාගතයක් නිර්මානය වීම යි."

ඓතිහාසික වර්ධනයන් දෙස හෙලන ඉක්මන් බැල්මකින් එලිදරව් වන්නේ සංග්‍රාමාවතීර්නව සිටින බලවතෙකුගේ ශක්තියෙහි සහ වීර්යයෙහි පදනම වන්නේ රට අභ්‍යන්තරයෙහි පැන නැගෙන විරුද්ධත්වය වැලකීමට සහ මර්දනය කිරීමට ඊට හැකි තරම මත ය යන්න යි. පලමු වන ලෝක යුද්ධයේ දී ජර්මානු හමුදාවේ "වීර්යය" උදෙසා වූ දැවැන්ත කොන්දෙසියක් බවට පත් වූයේ ජරමානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය කම්කරු පන්තිය පාවා දීම යි; දෙවන ලෝක යුද්ධයේ දී නාසිවරු කම්කරුවන්ගේ ව්‍යාපාරය කුඩු පට්ටම් කර දැමූහ. වඩා මෑතක දී, එක්සත් ජනපදය වියට්නාම් යුද්ධයෙන් පරාජයට පත් වූයේ ප්‍රධාන කොට ම යුද්ධයට එරෙහිව දේශීයව වර්ධනය වී ආ ප්‍රතිරෝධය කරන කොට ගෙන ය.

මෙහි දී, ෆිෂර්ගෙන් සහ හරිතයන්ගෙන් මීට වැඩිමනත් දෙයක් අපේක්ෂා කල හැකි ය. ඔවුහු සාමවාදීන්ගේ සිට යුද්ධයේ උද්‍යෝගිමත් යෝජකයන් බවට පරිනාමනය වී සිටිති. සියවසකට පෙර, සිය අධිරාජයාගේ නාවික වැඩ පිලිවෙල හමුවේ ජර්මානු මධ්‍යම පන්තිය සිහි මුර්ඡා විය. අද දවසේ හරිතයෝ, සිය ජර්මානු හමුදා ඇෆ්ඝනිස්ථානයෙහි විහිදුවා ලීම ගැන උද්‍යෝගිමත්ව සිටිති.

රූපාකාරය වෙනස් වී ඇති නමුත් අන්තර්ගතය එකක් ම ය. මෙම ඉරියව්වට නො වැලැක්විය හැකි ලෙස ම ඊට ම ආවේනික වූ තර්කයක් ඇත. යුද්ධයට එරෙහිව මහජන විරද්ධත්වය වැඩී එන විට එම මහජන ප්‍රතිරෝධය සමග සටන් වැදීම සඳහා රාජ්‍යය ගන්නා මර්දනකාරී පියවරයන්ට සහාය දෙන්නට ෆිෂර් ද හරිතයන් ද එතරම් ම සූදානමක් පල කරනු ඇත.

පීටර් ෂ්වාර්ස්